# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

World Health Organization
Sri Lanka

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 29.ගරාජය

ගරාජ් සේවකයින් වාහන අළුත්වැඩියා කිරීම, අභ්‍යන්තර පිරිසිදු කිරීම, මෝටර් රථයේ බඳ සේදීම වැනි සේවාවන් සපයන අතර ඔවුන් සේවාදායකයින් සමඟ සම්බන්ධ වේ.

**නිශ්චිත උපදෙස්**

**සේවා යෝජකයන්**

- ප්‍රමාණවත් සනීපාරක්ෂක සැපයුම් තිබිය යුතුය (උදා: මුහුණු ආවරණ, විෂබීජ නාශක, සබන්, ජල සැපයුම).
- ගෙන්වාගන්නා කම්කරුවන් ගණන හැකිතාක් සීමා කරන්න
- සේවකයින්ගේ සෞඛ්‍යය පිළිබඳව දිනපතා විමසීමේ ක්‍රමයක් ඇති කරන්න. (උණ සහ කැස්ස / සෙම්ප්‍රතිශ්‍යාව වැනි ශ්වසන රෝග ලක්ෂණ විමසන්න)
- සෞඛ්‍ය සම්පන්න හැසිරීම් පිළිබඳව කම්කරුවන් දැනුවත් කරන්න.
- අත් සේදීම සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දීම. සේවාදායකයා සමඟ සෘජුව මුණගැසෙන විට මුහුණු ආවරණයක් පැළඳිය හැකිය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරු / භාරකරුගේ වගකීම වේ.

**සේවකයන්**

- ගරාජය වෙත පිටත්ව යාමට පෙර සහ වැඩ මුරය අවසානයේ පිට වීමට පෙර අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් හා වතුරෙන් අත් සේදිය යුතුය.
- සෑම විටම පුද්ගලයන් දෙදෙනෙක් අතර (සෙසු සේවකයින් සහ සේවාදායකයින් සමඟ) අවම වශයෙන් මීටර 1 ක පරතරයක් පවත්වා ගත යුතුය.
- නිතර නිතර මුඛය, නාසය හෝ ඇස් ස්පර්ශ නොකළ යුතුය.
- ඉදිකිරීම් භූමියේ කෙළ ගැසීමෙන් වැළකී සිටිය යුතුය.
- මුහුණු ආවරණ නිසි ලෙස පැළඳිය යුතු අතර පාවිච්චි කල මුහුණු ආවරණ වැසිය හැකි බඳුනකට පමණක් බැහැර කළ යුතුය.
- කැස්ස හෝ කිවිසුම් යන විට වැලමිටේ ඇතුළත පැත්තෙන් ඔබේ නාසය සහ මුඛය ආවරණය කළ යුතුය.
- සේවාදායකයාට භාරදීමට පෙර ඇල්කොහොල් අඩංගු විෂබීජ නාශක දියරයකින් සූක්ෂ්මාකාරව පිරිසිදු කරන්න.
- ඔබට ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් ගරාජයට නොයා යුතුය.
- දුම් පානය තහනම් කළ යුතුය.

**සේවාදායකයින්**

- මුහුණු ආවරණ නිසි ලෙස පැළඳ ගන්න.
- ඔබට සුළු හෝ ශ්වසන රෝග තත්වයක් ඇත්නම් ගරාජයට ඇතුළු නොවිය යුතුය.
- හැකි සෑම අවස්ථාවකම ගරාජයට ඇතුළු වීමට පෙර අත් සෝදන්න.
- සෑම විටම මීටර් 1 ක ශාරීරික දුරක් පවත්වා ගන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙල**

- සියළුම සේවකයින්ට දැකිය හැකි ස්ථානවල සෞඛ්‍ය පණිවිඩ ප්‍රදර්ශනය කිරීම.
- ගරාජයට ඇතුල්වීමේ ස්ථානයේ හෝ රැඳී සිටින ස්ථානයේ සෞඛ්‍ය පණිවිඩ ප්‍රදර්ශනය කිරීම.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.